Sinhalese | සිංහල

imha
independent mental health advocacy

# ඔබේ හිමිකම් ගැන දැන ගන්න, ඔබේ අදහස් පවසන්න

**සැප්තැම්බර් 2023**

Independent Mental Health Advocacy (ස්වාධීන මානසික සෞඛ්‍ය උපදේශන) (IMHA) මගින් ඔබේ හිමිකම් ගැන දැන ගැනීමට හා ඔබේ අදහස් ප්‍රකාශ කිරීමට සහාය ලබා ගත හැකිය. (IMHA) යනු පහත අවස්ථාවල සිටින පුද්ගලයින් සඳහා නොමිලේ සැපයෙන හා රහසිගත උපදේශක සේවාවකි:

- අනිවාර්ය ප්‍රතිකාර ලබා ගන්නේ නම්, හෝ
- අනිවාර්ය ප්‍රතිකාර ලබා ගැනීම ගැන සිත්තැවුලෙන් සිටී නම්.

IMHA යනුVictoria Legal Aid මගින් සපයන සේවාවක් වන නමුත් එය නීති සේවාවක් නොවේ. IMHA ස්වාධීන මානසික සෞඛ්‍ය සේවා සපයයි.

## *අපි ඔබ අමතන්නෙමු*

2023 සැප්තැම්බර් 1 වන දින, Mental Health and Wellbeing Act 2022 (Vic) (මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම පනත) 2022) (Vic) අනුව ඔබ අනිවාර්ය ප්‍රතිකාර ලබා ගන්නා විට ප්‍රධාන අවස්ථාවල දී අපට දැනුම් දෙනු ඇති බව ප්‍රකාශ කරයි. ප්‍රධාන කරුණු ගැන දැන ගැනීමට පහත දැක්වෙන 'IMHAට දැනුම්දෙන්නේ කුමන අවස්ථාවලද' යන කොටස බලන්න

ඔබ විසින් එසේ නොකරන ලෙස ඉල්ලා සිටින අවස්ථාවල දී හැර අපි විසින් ඔබ අමතනු ඇත. අපි ඔබව අමතන විට, අප කරන දේ පැහැදිලි කරන අතර, ඔබට අපගේ සේවාවන් අවශ්‍ය වන්නේ දැයි තීරණය කළ හැකිය. ඔබට ඇමතීම සිදු නොකරන ලෙස අපට දැන්වීමට මෙම පත්‍රිකාවේ 'ඔබව ඇමතීම සිදු නොකරන ලෙස අපට කියන්න' කොටස බලන්න.

## *ඔබට අප ඇමතිය හැකිය*

ඔබ දැනට අනිවාර්ය ප්‍රතිකාර ලබා නොගන්නා නමුත් අනිවාර්ය ප්‍රතිකාර ලබා ගැනීම ගැන සිත්තැවුලෙන් සිටින අවස්ථාවල දී ද, ඔබට තව දුරටත් IMHA සේවාවන් වෙත ප්‍රවේශ විය හැක. අපට ඒ බව දැනුම් දෙනු නොලබන බැවින් ඔබ කෙලින්ම අප ඇමතීම අවශ්‍ය වනු ඇත. ඔබට 1300 947 820 ඔස්සේ අප ඇමතීමට, අපගේ www.imha.vic.gov.au වෙබ් අඩවියට පිවිසීමට හෝ imhacontact@imha.vic.gov.au වෙත ඊමේල් පණිවුඩයක් යැවීම සිදු කළ හැකි ය.

ඔබට ඔබේ ප්‍රතිකාර කණ්ඩායම සමඟ එකඟ විය නොහැකි යැයි හැඟීම හෝ ඔබ විසින් යමක් නොකළහොත් ඔබ අනිවාර්ය ප්‍රතිකාර සඳහා යොමු කරන බව ඔබේ ප්‍රතිකාර කණ්ඩායම පවසා තිබීම, අනිවාර්ය ප්‍රතිකාර ලබා ගැනීම ගැන පුද්ගලයන්ට ගැටලු ඇති විය හැකි පොදු හේතු අතර වේ.

## IMHA *විසින් ඔබට උපකාර කරන්නේ කෙසේද*

අපට පහත දෑ සඳහා උපකාර කළ හැකි ය:

- ඔබේ ඇගයීම, ප්‍රතිකාර, රැකවරණය සහ සුවය ලැබීම ගැන තොරතුරු අවබෝධ කර ගැනීමට
- ඔබේ ඇගයීම, ප්‍රතිකාර, රැකවරණය ගැන තීරණ ගැනීමට
- ඔබේ හිමිකම් අවබෝධ කර ගැනීමට හා ක්‍රියාත්මක කිරීමට
- වරණයන් පිළිබඳ පූර්ව ප්‍රකාශයක් කිරීමට
- යෝජිත උපකාරකරුවෙක් පත් කිරීමට
- දෙවැනි මානසික සෞඛ්‍ය මතයක් ලබා ගැනීමට
- නීතිමය උපදෙස් ලබා ගැනීමට
- Mental Health Tribunal (මානසික සෞඛ්‍ය විනිශ්චය සභාව) වෙත අයදුම් කිරීමට

- මානසික සෞඛ්‍ය හා යහපැවතුම් සේවා පද්ධති අවබෝධ කර ගැනීමට හා ඒවාට ප්‍රවේශ වීමට
- ඔබේ තීරණ, අදහස් හා වරණයන් මානසික සෞඛ්‍ය හා යහපැවතුම් සේවාවලට සහ අන් අයට ප්‍රකාශ කිරීමට
- පැමිණිල්ලක් සිදු කිරීමට.

අපට භාෂණ පරිවර්තකයෙකු සූදානම් කළ හැකිය. ඔබට 131 450 ඔස්සේ Translating and Interpreting Service (පරිවර්තන සහ  භාෂණ පරිවර්තන සේවාව) (TIS) අමතා අප සම්බන්ධ කරන  ලෙස ඉල්ලා සිටිය හැක.

ඔබේ කැමැත්ත ඇතිව ඔබේ මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම පිළිබඳ ඔබේ අදහස් නියෝජනය කිරීමට  IMHA ට හැකිය.

ඔබේ IMHA උපදේශක:

- ඔබ නියම කරන ආකාරයට කටයුතු කරනු ඇත
- ඔබේ කැමැත්ත නැතිව ක්‍රියාමාර්ග නොගනු ඇත
- ඔබට අවම වශයෙන් වයස අවුරුදු 16ක් නම්, ඔබේ යහපත සඳහා අන් අය විසින් සලකනු ලබන දේ මගින් මග පෙන්වනු නොලැබේ. ඔබට වයස අවුරුදු 15 හෝ ඊට අඩු නම්, ඔබේ අදහස් ප්‍රවර්ධනය කරන අතර ඔබේ හොඳම අවශ්‍යතා ආරක්ෂා කර ගැනීම සහතික කිරීම සඳහා ඔබේ පවුලේ අය, රැකබලා ගන්නන් සහ ආධාරකරුවන් සමග IMHA කටයුතු කරයි.

## *ඔබ නොඅමතන ලෙස අපට දන්වන්න*

ඔබව හඳුනාගත හැකි තොරතුරු ලබා දීම අවශ්‍ය වන අතර එමගින් පහත දැක්වෙන දේ අපට තහවුරු කර ගත හැකිය:

- ඔබට ඇමතීමට උත්සාහ නොකිරීමට
- ඔබේ අනිවාර්ය ප්‍රතිකාර ගැන අපට ලැබෙන තොරතුරු මකා දැමීමට.

ඔබ අපට සපයන තොරතුරු අපගේ පරිපාලන කාර්ය මණ්ඩලය විසින් හසුරුවනු ලැබේ. අප පෞද්ගලික තොරතුරු හසුරුවන ආකාරය සහ ඔබේ පෞද්ගලිකත්වය ආරක්ෂා කරන ආකාරය සොයා ගැනීමට ඔබට https://www.imha.vic.gov.au/how-we-handle-personal-information වෙත පිවිසිය හැක.

ඔබට  නො අමතන ලෙස පැවසීමට:

- 03 9093 3701 අමතන්න
- www.imha.vic.gov.au/optout වෙත ගොස් opt-out form පුරවන්න
- පහත දැක්වෙන පෝරමය පුරවා imhaadmin@imha.vic.gov.au ඔස්සේ හෝ තැපැල් මගින් අප වෙත එවන්න:

Independent Mental Health Advocacy

GPO Box 4380

Melbourne VIC 3001

- පහත කැමැත්ත පළ කිරීමේ ප්‍රකාශය සහ තොරතුරු සමග imhaadmin@imha.vic.gov.au වෙත ඊමේල් පණිවුඩයක් යොමු කරන්න.

ඔබට පෝරමය යොමු කිරීමට කාර්ය මණ්ඩල සාමාජිකයෙකුගෙන් හෝ ආධාරකරුවෙකුගෙන්  උපකාර ඉල්ලා සිටිය හැක.

______________________________ වන මා අනිවාර්ය ප්‍රතිකාර නියෝගයක් මත හෝ වෙනත් ප්‍රධාන අවස්ථාවක සිටියි නම් IMHA විසින් මාව සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය නැත. මෙයින් අදහස් කරන්නේ මගේ අනිවාර්ය ප්‍රතිකාර පිළිබඳව *IMHA* වෙත ලැබෙන අනාගත තොරතුරු මකා දැමෙනු ඇති බවයි.

උපන්දිනය: ____________________

අත්සන: ____________________

දිනය: ____________________

සමස්ත ප්‍රාන්ත රෝහල් UR අංකය (State-wide UR Number) SWURN: ____________________

මෙය රෝහල විසින් ඔබට ලබා දෙන විශේෂිත අංකයක් වන අතර, ඔබව නිවැරදිව හඳුනා ගැනීම සහතික කර ගැනීමට අපි මෙය භාවිතා කරන්නෙමු. ඔබ ඔබේ SWURN අංකය නොදන්නේ නම්, ඔබේ මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම සේවාවෙන් විමසිය හැකිය, නැතහොත් උපකාර සඳහා IMHA අමතන්න.

දුරකථන අංකය: ____________________

ඊමේල්: ____________________

ලිපිනය: ____________________

උපනගරය/නගරය: ____________________

තැපැල් කේතය: ____________________

ඔබ පසුව ඔබේ අදහස වෙනස් කර ගතහොත් හෝ සහ ඔබ අනිවාර්ය ප්‍රතිකාර ලබන විට IMHA විසින් සම්බන්ධ කර ගැනීමට කැමති නම්, ඔබට:

- 1300 947 820 අමතන්න
- imhacontact@imha.vic.gov.au වෙත ඊමේල් පණිවුඩයක් යොමු කරන්න
- www.imha.vic.gov.au ඔස්සේ අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න

## IMHA වෙත දන්වනු ලබන්නේ කුමන අවස්ථාවල දී ද?

පහත වදැක්වෙන අවස්ථාවල දී IMHA වෙත දන්වනු ඇත:

- ඔබ අධිකරණ හෝ ආරක්ෂක අංශ යටතේ වූ රෝගියෙකු නම් ඇතුළුව තාවකාලික ප්‍රතිකාර නියෝගයක් හෝ ප්‍රතිකාර නියෝගයක් මත තබා ඇති අවස්ථා
- ඔබේ සන්නිවේදන හිමිකම් සීමා කර ඇති විට
- ඔබේ තාවකාලික ප්‍රතිකාර නියෝගය, හෝ ප්‍රතිකාර නියෝගය ප්‍රජාවෙන් නේවාසික රෝගීන්ට හෝ නේවාසික රෝගීන්ගෙන් ප්‍රජාවට වෙනස් වී ඇති අවස්ථාවල
- ඔබේ තාවකාලික ප්‍රතිකාර නියෝගය, හෝ ප්‍රතිකාර නියෝගය හකුලාගෙන හෝ අවලංගු කර ඇති අවස්ථාවල
- ඔබට Mental Health Tribunal (මානසික සෞඛ්‍ය විනිශ්චය මණ්ඩලයේ) නඩු විභාගයක් සැලසුම් කර ඇත්නම්
- ඔබව හුදෙකලාව තබා තිබීම හෝ භෞතිකව හෝ රසායනිකව සීමා කර තිබීම වැනි සීමාකාරී මැදිහත්වීමක් භාවිතා කරන්නේ නම්
- වෙනත් නම් කරන ලද මානසික සෞඛ්‍ය සේවාවකට ප්‍රතිකාර සඳහා ඔබව මාරු කිරීමට ඔබේ ඇණවුම වෙනස් කරනු ලබන්නේ නම්.

ඔබ  ආරක්ෂක අංශ යටතේ වූ රෝගියකු නම්, IMHA වෙත ද දැනුම් දෙනු ලැබේ:

- ඔබව නම් කරන ලද මානසික සෞඛ්‍ය සේවාවක් වෙත භාරගනු ලබන විට, නැතහොත් ප්‍රවාහනය කරනු ලබන විට
- ඔබ නැවත බන්ධනාගාරයට මුදා හරින විට.

ඔබ අධිකරණය යටතේ වන  රෝගියෙකු නම්, IMHA වෙත දන්වනු ලබන්නේ:

- අධිකරණ වෛද්‍ය නිවාඩු මණ්ඩලය ප්‍රවාහනය අනුමත කරන්නේ නම් හෝ බලයලත් ආයතනයක් විසින් මෙහෙයවනු ලබන්නේ නම් හැර, ඔබව නම් කරන ලද මානසික සෞඛ්‍ය සේවාවකට රැගෙන යන විට
- ඔබේ මනෝ වෛද්‍යවරයා හෝ ප්‍රධාන මනෝ වෛද්‍යවරයා ඔබව වෙනත් නම් කරන ලද මානසික සෞඛ්‍ය සේවාවකට ප්‍රවාහනය කරන ලෙස යොමු කරන්නේ නම්
- දැඩි ලෙස නිරීක්ෂණය කරන ලද අධීක්ෂණ නියෝගයක් සඳහා Forensicare (Victorian Institute of Forensic Mental Health) (මානසික සෞඛ්‍ය පිළිබඳ වික්ටෝරියානු ආයතනය) නියෝගය සිදු කර ඇති විට.

## IMHA වෙත සම්බන්ධ වී වැඩිදුර විස්තර සොයා ගන්නේ කෙසේද

- www.imha.vic.gov.au වෙබ් අඩවියට පිවිසෙන්න නැත්නම් imhacontact@imha.vic.gov.au වෙත ඊමේල් පණිවුඩයක් එවන්න
- සතියේ දින හතේම (රජයේ නිවාඩු දින හැර) පෙ.ව. 9:30 – ප.ව. 4:30 දක්වා **1300 947 820** ඔස්සේ IMHA නීතීඥයින් විසින් මෙහෙයවෙන IMHA දුරකථන අංකය  අමතන්න.
- ඔබේ හිමිකම් පිළිබඳ පටිගත කිරීමක් ඇසීමට **1800 959 353** ඔස්සේ IMHA හිමිකම් අංකය අමතන්න .
- IMHA සම්බන්ධ කර ගැනීමට සහය වීමට මානසික සෞඛ්‍ය සේවා සපයන්නෙකුගෙන්, රැකවරණකරුවෙකුගෙන් හෝ වෙනත් ආධාරකරුවෙකුගෙන් ඉල්ලා සිටින්න.
- ඔබ IMHA පිළිබඳ  පසුපෙවුම් අදහස් දැක්වීමට හෝ පැමිණිල්ලක් කිරීමට කැමති නම්, කරුණාකර අප හා සම්බන්ධ වන්න, නැතහොත් අපගේ වෙබ් අඩවියේ  අදහස් දැක්වීමේ අංශයට පිවිසෙන්න.
- 131 450 අමතා භාෂණ පරිවර්තකයෙක් නොමිලේ ලබාගෙන, ඉන්පසු 1300 947 820 ඔස්සේ අපව සම්බන්ධ කරන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටින්න.